(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 1(4).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2018 ජූනි 22 වැනි සිකුරාදා**

---

## 2018 ජූලි 03 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 1),— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 මාර්තු 16 දිනැති අංක 2062/45 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 2),— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 අප්‍රේල් 17 දිනැති අංක 2067/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 3),— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 මැයි 01 දිනැති අංක 2069/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 4),— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 මැයි 02 දිනැති අංක 2069/19 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 5),— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 මැයි 15 දිනැති අංක 2071/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 23 දිනැති අංක 2059/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 07 දිනැති අංක 2061/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 19 දිනැති අංක 2063/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 01 දිනැති අංක 2064/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 01 දිනැති අංක 2069/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 08 දිනැති අංක 2070/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 09 දිනැති අංක 2070/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 20 දිනැති අංක 2071/85 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථා,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ තැපැල් ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව තැපැල් තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජුනි 07 දිනැති අංක 2074/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.20 දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථා අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2018 අගෝස්තු 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

25/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි, මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් රෝහල තුළ දැනට සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව, තනතුරු නාම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වත්මන් යහපාලන රජය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා සංවර්ධනයට මෙතෙක් ගත් හා ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

53/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 159ට අනුව, රබර් නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ ප්‍රධාන සැලැස්මක් (Master Plan) සකසනු ලැබුවේද;

(ii) එසේ නම්, එම සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(iii) උක්ත සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට රුපියල් මිලියන 100ක් ලබා දුන්නේද;

(iv) එසේ නම්, එම මූල්‍ය ප්‍රතිලාභ උපයෝජනය කර ගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

139/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ස්ථාපිත කළ දිනය කවරේද;

(ii) දැනට මෙම ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර පවත්වාගෙන යනු ලබන හිමිකරුවන්ගේ නම් කවරේද;

(iii) දැනට මෙම ආර්ථික මධ්‍යස්ථානය ආශ්‍රිතව මතු වී ඇති ගැටලු විසඳීම සඳහා හා ආර්ථික මධ්‍යස්ථානයේ පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා ඔබ අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

169/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාල පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එම කාර්යාලවලට දැනට පත්වීම් ලබා සිටින සහකාර තේ කොමසාරිස්වරුන්ගේ සුදුසුකම් කවරේද;

(iv) ඔවුන් එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේද;

(v) කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය කාර්යාලය සඳහා ස්ථිර සහකාර තේ කොමසාරිස්වරයෙකු පත් නොකර සිටින්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

206/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.07.31 දිනට ආණ්ඩුවේ රැකියා දස ලක්ෂයේ ව්‍යාපෘතිය යටතේ ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

224/'18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ, මතුගම අධ්‍යාපන කලාපයේ පිහිටි කලෙලමගල් දෙමළ විද්‍යාලයේ ශිෂ්‍යයන් හාරසියයකට අධික පිරිසක් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලබමින් සිටින බවත්;

(ii) මෙම පාසල "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා මුල්ගලක් තැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ (ii)හි සඳහන් සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(ii) ඉහත පාසලෙහි අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම පන්ති ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

251/'18

ගරු හේෂාන් විතානගේ මහතා,— සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත සමෘද්ධි සංවර්ධන නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සේවයේ නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) සමෘද්ධි සංවර්ධන නිලධාරි පුරප්පාඩු පවතින ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iv) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

398/'18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික කුරුඳු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) ලෝක කුරුඳු අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන්නේද;

(iv) කුරුඳු අපනයනයෙන් ලැබෙන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා අලුතින් වගාකර ඇති කුරුඳු වගා අක්කර ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කුරුඳු වගා බිම් ප්‍රමාණය ක්‍රමානුකූලව අඩුවී තිබේද;

(iii) එසේ වගාබිම් ප්‍රමාණය අඩුවී ඇත්නම්, එයට බලපා ඇති හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

432/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව නගර සීමාවේ පිහිටා ඇති නගර සභා ගොඩනැගිල්ලට පිටුපස ඇති ප්‍රදේශයේ පවුල් විශාල සංඛ්‍යාවක් ජීවත් වන බවත්;

(ii) ඔවුන් නිසි ප්‍රමිතියකින් තොර පැල්පත් සහ නිවාස ඉදිකර ඒවායේ පදිංචි වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නගර සංවර්ධනයෙහිලා වැදගත් වන නගර සීමාවේ පිහිටා ඇති මෙම කොටස නිසි පිළිවෙළකට සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

458/'18

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004.12.26 දින ඇති වූ සුනාමි විපතට මුහුණ දුන් හම්බන්තොට නගර සභා නිවාස පාරේ අංක 3/19 දරන නිවසේ පදිංචිව සිටි ටී. එන්. අමීර් මහතා ඇතුළු 68 දෙනෙකුගේ ඉඩම් 2010.03.17 දින වෙරළ උද්‍යානයක් ඉදිකිරීම සඳහා පවරාගත් බවත්;

(ii) පවරා ගත් ඉඩම් සඳහා ඉහත සඳහන් පිරිසට මෙතෙක් වන්දි ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

500/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ ආරම්භක අරමුණු කවරේද;

(iii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්‍ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලවල සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ණය, ලබාගත් ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තුවන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

522/'18

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වෙළඳ ශේෂයේ හිඟය කොපමණද;

(ii) ඛනිජ තෙල් හා රත්‍රන් ආනයනයට වැය කර ඇති මුදල කොපමණද;

(iii) 2016 වර්ෂයේ තේ හා කුළුබඩු අපනයන ආදායම කොපමණද;

(iv) තේ හා කුළුබඩු ආදායම වැඩිකර ගැනීම සඳහා අදාළ ක්ෂේත්‍ර දිරිමත් කිරීමට රජය ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජංගම ගිණුමේ හිඟය රුපියල් මිලියන කොපමණද;

(ii) සේවා ගිණුම හා ද්විතීයික ආදායම් මත වූ ශුද්ධ ලැබීම් ශේෂය කොපමණද;

(iii) සේවා ගිණුමෙහි ප්‍රවර්ධනයන් සඳහා සංචාරක කර්මාන්තය දිරිගැන්වීමට ලබා දී ඇති ප්‍රභවයන් කවරේද;

(iv) විදේශ රැකියාවල නිරත පිරිස් වෙතින් ලැබෙන ප්‍රේෂණ දිරිගැන්වීම සඳහා යෝජිත පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

533/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, "නීලවල ගම" පාරම්පරික ස්වර්ණාභරණ කර්මාන්තය ඉතාමත් දියුණු ලෙස පැවති පැරණි ගම්මානයක් බව දන්නේද;

(ii) රන්රිදී කර්මාන්තයෙන් ජීවත් වූ මෙම ගමේ පවුල් අතරින් අද වනවිට කර්මාන්තයේ යෙදෙන්නේ පවුල් 03 ක් පමණක් බව පිළිගන්නේද;

(iii) දේශීය කර්මාන්තකරුවන් නඟා සිටුවීම වෙනුවෙන් එවකට ලක්සල මැදිහත්වීම නිසා නීලවල ගමේ රන්රිදී භාණ්ඩවලට විශාල ඉල්ලුමක් තිබූ නමුත්, අද වනවිට ලක්සල, ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකුගේ ආයතනයක් බවට පත්වීම හේතුවෙන් මෙම කර්මාන්තය දරුණු කඩා වැටීමකට ලක්වී ඇති බව එම ගමේ කර්මාන්තකරුවන් සළකන බව පිළිගන්නේද;

(iv) එබැවින්, නීලවල ගමට සුවිශේෂී වූ පැරණි කැටයම් සහිත රන්රිදී කර්මාන්තය නඟා සිටුවීමට රජය මැදිහත් වී පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

558/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය සහ කැළිකසළ බැහැර කරන ස්ථාන කවරේද;

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ව්‍යාපෘතියක් මෙම පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී තිබේද;

(iii) එසේ නම්, 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ව්‍යාපෘතිය සඳහා එක් එක් පළාත් පාලන ආයතනයකට ලබා දී ඇති පහසුකම් හා මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අගෝස්තු 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

54/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 161ට අනුව, තේ සහ රබර් කර්මාන්තය උනන්දු කරවීම සඳහා, එකී වගාවන්හි නියුතු සමාගම්වලට වසර දෙකක බදු නිදහස් කිරීමක් ලබා දී තිබේද;

(ii) උක්ත යෝජනාවට අනුව, එකී බදු නිදහස ලබා ගත් සමාගම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

(iii) උක්ත බදු නිදහස ලබා දීමෙන් රජයට අහිමි වූ බදු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

170/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 27/88 හා අංක 01/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව රාජ්‍ය සේවයේ හා රාජ්‍ය සංස්ථාවන්හි පුරප්පාඩු පිරවීමේ දී ඉන් 3%ක ප්‍රතිශතයක් සුදුසුකම් ලත් හා ආබාධිත තත්ත්වය ඔවුන්ගේ කටයුතුවලට බාධාවක් නොවන ආබාධිත පුද්ගලයන්ගෙන් පිරවිය යුතු බවත්;

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයට නිලධාරීන් බඳවාගැනීමේ 2004 (2005) විවෘත තරඟ විභාගයට විභාග අංක 0087548 යටතේ පෙනී සිට ලකුණු 135 ක් ලබා සමත්ව සිටින 1 1/4 කණුව, අම්පාර පාර, සියඹලාණ්ඩුව යන ලිපිනයේ පදිංචි කායික ආබාධ සහිත තැනැත්තෙකු වන ඩබ්ලිව්. එල්. ආර්. එන්. ලියනගේ මහතා තමා ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට සළකා බලන ලෙසට කර ඇති අභියාචනය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ආබාධ සහිත පුද්ගලයන් ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට නොහැකි බව සඳහන් කරමින් ප්‍රතික්ෂේප කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයට ආබාධ සහිත පුද්ගලයන් බඳවා නොගත යුතු බවට විධිවිධාන පවතීද;

(ii) නොඑසේ නම්, ඩබ්ලිව්. එල්. ආර්. එන්. ලියනගේ මහතාට යුක්තිය ඉටුකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

207/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.08.18 දින සිට 2017.07.31 දින දක්වා කාලය තුළ නාගරික සංවර්ධන අධිකාරියට බඳවා ගත් උපදේශකයන්ගේ, සම්බන්ධීකාරකවරයන්ගේ සහ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයන්ගේ,

(i) නම්;

(ii) අධ්‍යාපන සුදුසුකම්;

(iii) වෘත්තීය සුදුසුකම්;

(iv) වැටුප් සහ දීමනා;

(v) කාර්ය මණ්ඩල පහසුකම්;

(vi) වාහන ඇතුළු වෙනත් පහසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

225/'18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, කෝපායි ගුරු පුහුණු විද්‍යාලයේ 600ක පමණ ශිෂ්‍යයන් පිරිසකට නේවාසිකව තම අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාමට පහසුකම් තිබෙන බවත්;

(ii) නමුත්, ශිෂ්‍ය නිවාසය වසර 25කින් පමණ ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(iii) ඒ හේතුවෙන් ගුරු සහායක පත්වීම් ලබා රුපියල් දස දහසක දිරි දීමනාවක් සහිතව පුහුණුව ලබන ශිෂ්‍යයන් හට, බාහිර නවාතැන් සඳහා විශාල මුදලක් දැරීමට සිදුවීමෙන් දුෂ්කරතාවන්ට මුහුණපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ශිෂ්‍යයන්ගේ පහසුව සඳහා කෝපායි ගුරු පුහුණු විද්‍යාලයේ නේවාසිකාගාරය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

399/'18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ මුළු දුර ප්‍රමාණය කොපමණද;

(ii) මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම මාර්ගය ඉදිකිරීමේදී ඉඩම් හා අනෙකුත් දේපළ අහිමිවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් වෙනුවෙන් ලබාදීමට නියමිත වන්දි මුදල් මේ වනවිටත් ලබාදී තිබේද;

(v) එසේ නම්, ගෙවා ඇති මුළු වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015, 2016 සහ 2017 දක්වා, දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් රජය උපයාගත් මුළු ආදායම වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වර්ෂවලදී මාර්ගයේ අලුත්වැඩියා සඳහා වෙන් කළ මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

433/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 492 - අමුණුවැටිය ග්‍රාම නිලධාරි වසමේ, කලාවැව කුඹුරුයාය මැදින් අලහප්පෙරුමගම දක්වා දිවෙන කෘෂි මාර්ගය ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) ගොවීන් 1000 ක් පමණ තමන්ගේ එදිනෙදා කටයුතු සිදු කිරීමට මෙම මාර්ගය යොදා ගන්නා අතර අස්වනු නෙලන සමයේ දී ඔවුන් තම අස්වැන්න මෙම කෘෂි මාර්ගය ඔස්සේ ප්‍රවාහනය කිරීමේදී බොහෝ දුෂ්කරතාවන්ට ලක්වන බවත්;

(iii) මෙම මාර්ගය අවුරුදු 30 කින් පමණ ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය මේ වනතෙක් ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතුව කවරේද;

(ii) මේ සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

459/'18

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.01.01 දින සිට 2017.04.30 දින දක්වා ජනාධිපතිවරයා විසින් සිදුකර ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල නම් කවරේද;

(iii) එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජනාධිපතිවරයා සමඟ එක් එක් සංචාරය සඳහා සහභාගී වූ අමාත්‍යවරයන්, මන්ත්‍රීවරයන් සහ නිලධාරීන් ඇතුළු සමස්ථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ජනාධිපතිවරයා සමඟ සංචාරවලට සහභාගි වූ සෙසු පුද්ගලයන්ගේ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

501/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල ඇතුළු කෘෂිකාර්මික කටයුතුවල නිරත වන බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය විශාල ගැටළුවක් වී ඇති බව පිළිගන්නේද;

(ii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් වගා හානි වූ ජනතාවට වන්දි ගෙවීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

523/'18

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිවාස තොරතුරු ලබාගැනීමේ විශේෂ ව්‍යාපෘතියක් වෙනුවෙන් නිලධාරීන් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, බඳවාගත් එම එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කවරේද;

(iii) ඔවුන් බඳවාගෙන ඇත්තේ ස්ථිර පදනමින්ද, අනියම් පදනමින්ද, විශේෂ ව්‍යාපෘති සඳහා පමණක්ද යන්න සඳහන් කරන්නේද;

(iv) ඔවුන්ගේ මාසික වැටුප/දෛනික දීමනාව කොපමණද;

(v) විශේෂ හෝ අනියම් පදනමකින් බඳවාගෙන තිබේ නම්, ඔවුන්ගේ සේවා කාලය කොපමණද;

(vi) එසේ බඳවා ගැනීමට මුදල් ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(vii) එසේ නම්, ඒ කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

534/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැල්මඩුල්ල, කිරිබත්ගල කන්ද නායයෑම හේතුවෙන් එම ගමේ පවුල් 30කට ආසන්න පිරිසකට උන්හිටිතැන් අහිමි වූ බවත්;

(ii) ආපදාවට ලක් වූ පවුල් සඳහා විකල්ප ඉඩම් ලබාදීමට තීරණය කර ඇත්තේ ගමෙන් කි.මී. 20ක පමණ ඈතින් පිහිටි දොඹගම්මන නමැති ප්‍රදේශයෙන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එලෙස දුර බැහැර ප්‍රදේශවලින් ලබාදී ඇති ඉඩම් වෙනුවට එම ගමට ආසන්නයේ පිහිටි කිරිබත්ගල රාජ්‍ය වතුයායෙන් ඉඩම් ලබාදෙන ලෙස ඔවුන් ඉල්ලා ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට කිරිබත්ගල රාජ්‍ය වතුයායෙන් ඉඩම් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

559/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාදම්පේ, ඓතිහාසික තනිවැල්ල දේවාලය අසළ කිනිපිටිය වැව නමින් වැවක් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම වැවේ ජලයෙන් වගා කරන කුඹුරු ප්‍රමාණය කොපමණද;

(iii) එමගින් ප්‍රතිලාභ ලබන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) අද වනවිට එම වැවේ විවිධ ජලජ ශාක වැඩී වැව ඉතා අබලන් තත්ත්වයට පත්වී තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, එම වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

580/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ ජනවාරි සිට මේ දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාර්තා වී ඇති ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලසීමාව තුළ ඩෙංගු රෝගයෙන් මියගිය පුද්ගලයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඩෙංගු අවදානම් කලාප ලෙස නම් කර ඇති සෞඛ්‍ය සේවා බලප්‍රදේශ කවරේද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

987/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අගෝස්තු 21 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මහනුවර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සංවර්ධන ව්‍යාපෘතියේ නම, වැයකරන ලද මුදල, කොන්ත්‍රාත් ලබාදුන් සමාගමේ නම, එම සමාගමට ලබාදුන් මුදල සහ විචෘත කිරීමට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශය විසින් මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

55/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 206ට අනුව, 2011 අංක 43 දරන ඌන උපයෝජන වත්කම් සහ ඌන ක්‍රියාකාරි ආයතන පුනරුදය කිරීමේ පනත මඟින් අපහසුතාවයට පත් කරන ලද ආයෝජකයන්ගේ සහ ව්‍යාපාරවල නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) 2011 අංක 43 දරන පනත මඟින් අපහසුතාවයන්ට පත් වූ ව්‍යාපාරවලට සහන ලබාදීමට හෝ පහසුකම් ලබාදීමට රජය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) උක්ත අයවැය යෝජනාව අනුව, දේශීය හා ගෝලීය ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ හෝ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන නව නීති රීති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

140/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල සිට දඹුල්ල දක්වා ඉදිවෙන මධ්‍යම අධිවේගී මාර්ගය හේතුවෙන් දඹුල්ල ප්‍රදේශයේ ඉඩම් අහිමි වන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) එම පුද්ගලයන්ට වන්දි ලබා දීමේ බරපතල ගැටලු මතු වී තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

171/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය විවෘත කළ දිනය කවරේද;

(ii) එම වෙළඳ සංකීර්ණයේ රථගාල විවෘත කළ දිනයේ සිට එමඟින් ලංකා ධීවර සංස්ථාව වාර්ෂිකව ලැබූ ආදායම කොපමණද;

(iii) එම රථගාලේ ආදායමෙන් කොටසක් පෞද්ගලික සමාගමක් වෙත හිමි වන්නේද;

(iv) එසේ නම්, එම මුදල වාර්ෂිකව කොපමණද;

(v) එම මුදල එකතු කිරීම ඉහත පෞද්ගලික සමාගමට ලබා දී ඇත්තේ ටෙන්ඩර් ක්‍රමවේදයක් අනුවද;

(vi) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද අනෙක් සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

208/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014, 2015 සහ 2016 යන වර්ෂවලදී රාජ්‍ය ණය ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) 2014, 2015 සහ 2016 යන වර්ෂවලදී ඒක පුද්ගල රාජ්‍ය ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

253/'18

ගරු හේෂාන් විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බලශක්ති කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය පිහිටුවනු ලැබූ නීතිමය පදනම කවරේද;

(ii) එම ආයතනය ආරම්භ කිරීමෙන් පසු ඉටු කරන ලද ප්‍රධාන කාර්යය කවරේද;

(iii) එම ආයතනය වෙනුවෙන් කරන ලද ආයෝජනයට සාපේක්ෂව, ප්‍රතිඵලයක් නොලැබී ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

434/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව නගරයේ පිහිටා ඇති බස් නැවතුම්පොළ 1977 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රමානුකූලව අලුත්වැඩියා කර නොමැති බැවින්, ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) මේ හේතුවෙන් මගීන් මහත් හිරිහැරයට ලක් වන අතර බස් නැවතුම්පොළෙහි බස් හැසිරවීමද ඉතාමත් අසීරු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බස් නැවතුම්පොළ ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම් එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

460/'18

ගරු බිමල් රත්නායක මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

502/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් අතරින් තාක්ෂණික විද්‍යාගාර පහසුකම් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ සිසුන්ගේ තාක්ෂණික දැනුම වැඩි කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

535/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිවිධ හමුදාව සඳහා පුද්ගලයන් බඳවාගැනීමේදී, ආධුනික අපේක්ෂකයාගේ කල්ක්‍රියාව, චරිතය හා අධ්‍යාපන සුදුසුකම් ඉතා උසස් තත්ත්වයෙන් තිබුනද, පියාට අනවසර මත්පැන් චෝදනා තිබීම හෝ දඩ ගැසීම් සිදු කර තිබීම හේතුවෙන්, ආධුනික අපේක්ෂකයාගේ බඳවාගැනීම අහෝසිවී යන බව එතුමා දන්නෙහිද?

(ආ) මේ නීතිය ඉවත් කරලීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

560/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති මුස්ලිම් විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම දිස්ත්‍රික්කයේ දැනට සිටින මෞලවි ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෞලවි ගුරු හිඟය පියවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

581/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සහ 2017 වර්ෂයේ ජනවාරි සිට මේ දක්වා ශ්‍රී ලංකාව බුලත් අපනයනය මඟින් ඉපැයූ ආදායම කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ බුලත් වගාවේ නියුතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) අපගේ ප්‍රධාන බුලත් ගැණුම්කරුවා වන පකිස්ථානය බුලත් සඳහා අධික බද්දක් පැනවීම හේතුවෙන් මේ වනවිට ගොවීන්ට බුලත් විකුණා ගැනීමට නොහැකි තත්ත්වයක් පවතින බව දන්නේද;

(iv) මේ සඳහා මැදිහත්වී බුලත් වගාකරන්නන්ගේ ජීවන මට්ටම උසස් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

964/'18

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3(1) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා 2017 වර්ෂයේ විභාගය පැවති දිනය කවරේද;

(ii) ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පැවති මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවති බව පිළිගන්නේද;

(iii) එම නිසා, විභාග අපේක්ෂකයන්ට ඉහත ඕනෑම භාෂාවකින් පිළිතුරු සැපයිය හැකි වූ බව පිළිගන්නේද;

(iv) ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා සිංහල භාෂාවෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට තේරී පත්වීමට අවස්ථාවක් ලබා නොදී තිබේද;

(v) එසේ නම්, සිංහල මාධ්‍ය ප්‍රශ්න පත්‍රයටද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුයැයි අදාළ විභාගය සඳහා අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රයේ හෝ වෙනත් ආකාරයකින් පූර්ව දැනුම්දීමක් කර තිබුණේද;

(vi) ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයීම නුසුදුසුකමක් වන්නේ යැයි පූර්ව දැනුම්දීමක් කර නොතිබියදී, සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන් තෝරා නොගැනීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

988/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අගෝස්තු 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

56/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 207 හි "පසුගිය රජය යටතේ නොමනා අනුග්‍රහ ලබමින්, අධික ලාභ ඉපයූ සමාගම් සඳහා අපි සුපිරි වාසි බද්ද පැනවූයෙමු" යනුවෙන් සඳහන් බැවින්; එලෙස නොමනා අනුග්‍රහ ලබමින් අධික ලාභ උපයා, සුපිරි වාසි බද්ද ගෙවූ සමාගම්වල නාමලේඛනයක් සහ ඒ ඒ සමාගම් විසින් ගෙවන ලද බදු ප්‍රමාණය කොපමණද;

(ii) සුපිරි වාසි බද්ද ගෙවූ සමාගම්, වර්තමාන රජය යටතේ, රජයේ ව්‍යාපෘති සඳහා දායකත්වයක් සපයනු ලබන්නේද;

(iii) එම සමාගම් විසින් සුපිරි වාසි බද්ද ගෙවීමෙන් පසු, ඇරඹූ නව ආයෝජන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය මඟින් විශේෂිත අනුග්‍රහයන් ලබාදී තිබේද;

(iv) සුපිරි වාසි බද්ද ගෙවූ සමාගම් අතරින්, පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාශය වෙත කැඳවා ප්‍රශ්න කළ සමාගම් කවරේද;

(v) මූල්‍ය අපරාධ පරීක්ෂණ අනුව, සුපිරි වාසි බදු ගෙවූ සහ එයට අතිරේකව වෙනත් දඩයක් ගෙවූ සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

141/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්තොට, හෙල්වත්ත කන්ද, දඹගොල්ල ප්‍රදේශයේ, පොළව ගිලා බැස තිබෙන බව දන්නේද;

(ii) එම ගිලා බැසීම හේතුවෙන් හානි වූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රදේශයේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමට අමාත්‍යාංශය මැදිහත් වන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

173/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක්සත් රාජධානියේ, ඩාට්මත් (Dartmouth) හි රාජකීය නාවික ඇකඩමියේ පුහුණුව සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් තෝරා යවනු ලැබූ නාවික නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) එම පුහුණුවෙන් පසු, එක් එක් නිලධාරියා නාවික හමුදාවේ සේවය කළ කාලය සහ සේවය අවසන් කරන විට දැරූ නිලය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා එම පුහුණු අවස්ථා තවමත් ලබා දෙන්නේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

191/'18

ගරු ඉම්රාන් මහරුෆ් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය රජය කාලයේ ත්‍රිකුණාමලය - මඩකලපුව, A15 මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලද බවත්;

(ii) මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී උප්පාරු ප්‍රදේශයට යාබදව පිහිටි මුරින්ජාරු ප්‍රදේශයේ ඉදිකළ යුතුව තිබූ බෝක්කුව ඉදි නොකළ බවත්;

(iii) එම නිසා, ගංවතුර බැස යාමට නොහැකිව කින්නියා ප්‍රදේශය ගංවතුරෙන් යටවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ස්ථානයේ බෝක්කුවක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, බෝක්කුව ඉදිකිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

194/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයේදී, සීමාසහිත ලංකා රෝහලේ කොටස් හිමියෙකු ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම කාල පරිච්ඡේදය තුළදී සීමාසහිත ලංකා රෝහලේ සභාපති ලෙස ඒ මහතා ලබාගත් වැටුප් සහ දීමනා කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ සීමාසහිත ලංකා රෝහල වාර්තා කළ වාර්ෂික ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

239/'18

ගරු හේෂාන් විතානගේ මහතා,— සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ජීවත්වන පවුල් අතරින් දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වන පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පවුල්වල ජීවන මට්ටම උසස් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

390/'18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට රට තුළ සමෘද්ධි සහනාධාරය ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා 2017 අයවැයෙන් වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(iii) එම ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iv) එම සමීක්ෂණය සඳහා සහභාගී වූ නිලධාරින්ට යම් දීමනාවක් ලබා දුන්නේ නම්, ඒ කවර පදනමක් මතද;

(v) එම සමීක්ෂණයේ අරමුණ කවරේද;

(vi) එම සමීක්ෂණය සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

422/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ධාතුසේනපුර, කලාවැව, මහඅක්කරය වත්ත සහ කැළණිවත්ත යන ප්‍රදේශවල කුඹුරු ඉඩම් අක්කර 100 ක පමණ ප්‍රමාණයක් කුරුණෑගල වැව්ලි සමාගමකට බදු දී ඇති බවත්;

(ii) මෙම ඉඩමේ අද ගොවීන් ලෙස ගොවීන් දීර්ඝ කාලයක් පුරා ගොවිතැන් කටයුතුවල නියැලෙන බැවින්, වැවිලි සමාගමෙන් මෙම ඉඩම් නිදහස් කර අද ගොවීන්ට සින්නක්කර අයිතිය ලබාදීමට කටයුතු කරන මෙන් ඉපලෝගම ප්‍රාදේශීය ලේකම්වරයා සහ ඉඩම් අමාත්‍යාංශය දැනුවත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉඩම්වල සින්නක්කර අයිතිය මෙම ගොවීන්ට ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

461/'18

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහා පරිමාණ වංචා දූෂණ පිළිබඳව සොයා බැලීමේ ජනාධිපති විමර්ශන කොමිසමට 2015 සිට 2017 වර්ෂයේ ජූනි 30 දින දක්වා ලැබුණු පැමිණිලි සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2015 සිට 2017 ජූනි 30 දක්වා,

(i) විභාග කර අවසන් කර ඇති, විභාග කරමින් පවතින සහ විභාග කිරීම ආරම්භ නොකළ පැමිණිලි සංඛ්‍යාව;

(ii) අධිකරණයන්හි නඩු පවරා ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iii) නඩු පැවරීමට හෝ නීතිපති උපදෙස් සඳහා යොමුකර ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iv) මේ වනතෙක් නීතිපති උපදෙස් නොලැබුණු පැමිණිලි සංඛ්‍යාව;

(v) පවරා ඇති නඩුවලින් දේශපාලනඥයන් හා සම්බන්ධ නඩු සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

475/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධව විගණකාධිපතිවරයාගේ අංක SIN/B/AG/KI/2017/02 හා 2017 අප්‍රේල් 20 දින ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති විමර්ශණ වාර්තාව පිළිබඳ ඔබ දන්නෙහිද?

(ආ) (i) එම වාර්තාවේ ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදේශකවරුන් පත්කිරීම සම්බන්ධව අනාවරණය කර ඇති අංක 2 (අ) (i) සිට (x) දක්වා කරුණු;

(ii) එම අනාවරණයන්ට අදාළව අංක 2 (අ) (i) සිට (xiii) දක්වා නිරීක්ෂණය කර ඇති කරුණු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

524/'18

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් "සහභාගිත්ව සංවර්ධන වැඩසටහන්" යටතේ 2015 වර්ෂයේ සිට මේ දක්වා නිලධාරීන් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිලධාරීන් සඳහා මාසික වැටුපක් හෝ දීමනාවක් ගෙවන්නේ නම්, ඒ කොපමණද;

(iv) එසේ බඳවාගත් එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, අයත් වන ග්‍රාම නිලධාරී වසම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යන තොරතුරු අඩංගු ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(vi) එම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ඵලදායී ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

536/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ මුල් භාගයේදී සහ 2017 වර්ෂයේ වෙළෙඳපොළේ වී වගාව සහ වෙනත් වැවිලි සඳහා භාවිතා කරනු ලබන විවිධ පොහොර වර්ගවල මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2016 වර්ෂය මුල පැවති පොහොර මිල අනුව සැසඳීමේදී, ඒ වනවිට පොහොර මිල වැඩිවී ඇති බව පිළිගන්නේද;

(iii) 2016 වර්ෂය මුල වෙළෙඳපොළේ රු. 1300/- ක් වූ කිලෝ 50ක පොහොර මිටියක මිල 2017 දී රු. 2900/- දක්වා වැඩිවී තිබේද;

(iv) පොහොර මිල පාලනය නොකළහොත් හෝ පොහොර සහනය වෙළෙඳපොළ මිල ගණන් අනුව වැඩි නොකළහොත්, වැවිලි කර්මාන්තය ඇතුළුව කෘෂිකර්මාන්තය මත රඳුණු ජන ජීවිතය විශාල කඩා වැටීමකට ලක් වන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා යෝජනා කරන විසඳුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

989/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අගෝස්තු 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

16/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් පෙර පාසලේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා අමාත්‍යාංශය ලබාදුන් ආධාර ප්‍රමාණය කවරේද;

(iv) මහනුවර දිස්ත්‍රික්කයේ පෙර පාසල් පද්ධතියේ සංවර්ධනයට අමාත්‍යාංශය ගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

37/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 174 යෝජනාවට අනුව, ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන යටතේ අමතර වැඩසටහන් සඳහා වෙන්කළ රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදන 2016 වර්ෂය තුළදී වැයකළ ආකාරය පැහැදිලි කරන්නේද;

(ii) උක්ත යෝජනාව අනුව මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් "අමතර වැඩසටහන්" කවරේද;

(iii) මෙම අමතර වැඩසටහන් සඳහා වගකීම දරන ලද ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී,

(i) පාරිසරික සමතුලිත බව ආරක්ෂා කිරීම, තිරසර ඉඩම් කළමනාකරණය;

(ii) ජීව සම්පත් සංරක්ෂණය;

(iii) පරිසර දූෂණය පාලනය;

(iv) වන සම්පත ආරක්ෂා කිරීම;

සඳහා වැය කර ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

158/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.08 දින සිට මේ දක්වා කැබිනට් අමාත්‍යවරයන්, රාජ්‍ය අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් සඳහා වාහන මිලදී ගත් අවස්ථා කවරේද;

(ii) එක් එක් වාහනයේ වර්ගය හා මිල කවරේද;

(iii) එම වාහන සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

195/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2016 වර්ෂයේදී කොස්ගම, සාලාව යුද හමුදා අවි ගබඩාව පිපිරී යැමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

216/'18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ, පුනරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලයිපාඩු ගම්මානයේ ධීවර පවුල් 300කට අධික සංඛ්‍යාවක් ජීවත්වන බවත්;

(ii) මෙම පවුල් අතරින් පවුල් 100ක් පමණ සෘජුවම ධීවර කර්මාන්තයේද, අනෙකුත් පවුල් වෙනත් රැකියාවලද නිරත වුවද, ප්‍රමාණවත් ආදායමක් නොමැතිව ජීවත් වන බවත්;

(iii) ඉහත සඳහන් ධීවර කාර්මිකයන් දිනපතා කිලෝග්‍රෑම් 1000 කට අධික කකුළුවන් සහ මුහුදු ආහාර නෙළාගෙන ඒවා වෙනත් ස්ථානවලට යවා සකස් කර පිට පළාත්වලට යවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ජනතාවගේ ජීවනෝපාය පිළිබඳව සළකා බලා, එම ප්‍රදේශයේ මුහුදු ආහාර සකස් කරන කර්මාන්ත ශාලාවක් ඉදිකිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

240/'18

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඉහත සේවාවල සේවයේ නියුතු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රත්නපුර දිස්ත්‍රික්කයේ ඉහත එක් එක් සේවාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

400/'18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් වාර්ෂිකව සිදුවන අපරාධ ගණයට අයත් වන සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(ii) අපරාධ නඩුවලදී අධිකරණ ක්‍රියාමාර්ගවලින් වරදකරුවන් වන පුද්ගලයන්ගේ ප්‍රතිශතය කොපමණද;

(iii) එම අගය ආසියාවේ අනිකුත් රටවල් සමඟ සසඳන විට ඉහළ අගයක් ගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් රජය යෝජනා කරන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

435/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලාවැව සිට තිසාවැව දක්වා ජලය ගෙන යන යෝද ඇල බැම්ම හා සමඟ ඇති මාර්ගය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට අයත් බවත්;

(ii) මෙම මාර්ගයේ ගම්මාන 6ක පදිංචිකරුවන් ගමන් ගන්නා අතර, මෙය අවුරුදු 30ක පමණ කාලයක් ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය මේ වනතෙක් ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතුව කවරේද;

(ii) මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

472/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති අතර එම වාර්තාවේ ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල් බෑග් ලබාදීම සම්බන්ධව අනාවරණය කර ඇති ඡේද අංක 4 (ආ) (i) සිට (vii) දක්වා කරුණු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(ii) එම අනාවරණයන්ට අදාළව (ආ) (i) සිට (v) දක්වා සිදු කර ඇති නිරීක්ෂණ ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

537/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2016 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ බව සඳහන් කරමින් පුරප්පාඩු 980ක් සඳහා බඳවාගෙන ඇති බවත්;

(ii) නමුත්, මේ වනතෙක් විභාගයට පෙනී සිටි සෙසු අපේක්ෂකයන්ට ප්‍රතිඵල ලේඛනය පවා යවා නොමැති බවත්; අන්තර්ජාලයෙන්ද ලබාගැනීමට ඉඩක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ පිළිබඳව සොයා බලා ඉතිරි ප්‍රතිඵල නිකුත් කිරීමට පියවර ගෙන, ඒ අනුව සුදුසුකම් ලබන්නන් පුරප්පාඩු අනුව බඳවා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

561/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන, පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි රෝහල්, මධ්‍යම බෙහෙත්ශාලා සහ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ස්ථානවල නම් කවරේද;

(iii) ඉහත එක් එක් සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවක පුරප්පාඩු පවතීද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(vi) එම සෞඛ්‍ය මධ්‍යස්ථාන දියුණු කිරීමට සහ සේවක පුරප්පාඩු පිරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

582/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ගෙන්වන ලද කිරි ගවයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගවයන් ගෙන්වන ලද රටවල් කවරේද;

(iii) කිරි ගවයන් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) මේ වනවිට අපගේ වාර්ෂික කිරි නිෂ්පාදනයේ ප්‍රගතිය කවරේද;

(v) දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

966/'18

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (III වැනි ශ්‍රේණිය) තනතුර සඳහා 2016.12.31 දින තරඟ විභාගයක් පවත්වා 2017.03.13 සහ 14 දෙදින තුළ සම්මුඛ පරීක්ෂණද පවත්වා, 2017.06.09 දින බඳවාගැනීම් සිදු කර තිබේද;

(ii) ඒ අනුව, ආර්. කේ. එස්. ප්‍රසංගා මෙනෙවියට මාතර ප්‍රදේශයට පත්වීමක් ලබා දී මාස 2ක වැටුප් ගෙවීමෙන් අනතුරුව, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2017.07.31 දිනැති ලිපිය මඟින් එම පත්වීම අවලංගු කිරීමට හේතු කවරේද;

(iii) එම කරුණු පත්වීම ලබාදෙන ලද අවස්ථාවේදී සළකා නොබැලුවේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

990/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?